# මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல்கள் ஆணைக்குழு

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426
*web : www.elections.gov.lk* *e-mail : info@elections.gov.lk*

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය (10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய (10107)


මගේ අංකය : PE/2020/12
எனது இல.

ඔබේ අංකය :
உமது இல.

දිනය : 2020.06.18
திகதி

තරඟ කරනු ලබන සියලුම දේශපාලන පක්ෂ වල ලේකම්වරුන්/ බලයලත් නියෝජිතයින්,
ස්වාධීන කණ්ඩායම් නායකයින් වෙත,

*පාර්ලිමේන්තු මහ මැතිවරණය - 2020*
*මැතිවරණ ප්‍රචාරක කාර්යාල සීමා කිරීම*

***කාර්යාලයේ නාමපුවරු පිළිබඳ උපදෙස් 3 පිටුවේ 8 ඡේදයේ තිබේ.***

2020 අගෝස්තු මස 05 වන දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේදී මැතිවරණ ප්‍රචාරක කාර්යාල පවත්වා ගෙනයාමේ දී පිළිපැදිය යුතු කරුණු පිළිබඳව ඔබගේ අවධානය යොමුකිරීම් වස් මෙම ලිපිය නිකුත් කරනු ලැබේ.

02. 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 73 වගන්තිය යටතේ පවත්වාගෙන යා හැකි මැතිවරණ ප්‍රචාරක කාර්යාල සම්බන්ධයෙන් වූ විධි විධාන මෙසේය.

"73(1) යම් මැතිවරණ කොට්ඨාසයක යම් මැතිවරණයක බලයලත් නියෝජිතයෙකු වන හෝ කණ්ඩායම් නායකයකු වන නැතහොත් එකී බලයලත් නියෝජිතයාගේ හෝ කණ්ඩායමේ නායකයාගේ නියෝජිතයකු වන තැනැත්තකුට-

(අ) ඒ මැතිවරණ නාම යෝජනා කාල සීමාවේ පළමු දිනයෙන් ආරම්භව ඒ මැතිවරණයේ දී ඡන්ද විමසීමක් පවත්වනු ලබන දිනයට ඉහතින් ම වූ දිනයෙන් අවසන් වන කාල සීමාව ඇතුළත, ඒ මැතිවරණ කොට්ඨාසයේ එක් නිවේදිත මධ්‍ය මැතිවරණ කාර්යාලයක් හා එක් එක් ඡන්ද කොට්ඨාසයේ එක් නිවේදිත ශාඛා මැතිවරණ කාර්යාලයක් හැර, වෙනත් යම් මැතිවරණ කාර්යාලයක් නොතිබිය යුතුය;

(ආ) ඒ ඡන්ද විමසීම පවත්වනු ලබන දිනට ඉහතින් ම වූ දිනයෙන් ආරම්භව ඒ දිනයට ඉක්බිතිවම එළඹෙන දිනයෙන් අවසන් වන කාල සීමාව ඇතුළත, මැතිවරණ කොට්ඨාසයේ එක් නිවේදිත මධ්‍ය මැතිවරණ කාර්යාලයක් සහ ඒ මැතිවරණ කොට්ඨාසය සඳහා වූ යම් පිලිගත් දේශපාලන පක්ෂයක් විසින් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් නාම යෝජනා කරන ලද එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් එක් නිවේදිත ශාඛා මැතිවරණ කාර්යාලයක් හැර වෙනත් යම් මැතිවරණ කාර්යාලයක් නොතිබිය යුතුය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් බලයලත් නියෝජිතයකුගේ හෝ කණ්ඩායම් නායකයකුගේ හෝ අපේක්ෂකයකුගේ සාමාන්‍ය පදිංචි ස්ථානය මැතිවරණ කාර්යාලයක් ලෙස පාවිච්චි කිරීම ඒ උප වගන්තියේ විධි විධාන කඩ කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතුය."

03. ඒ අනුව පවත්වාගෙන යා හැකි මැතිවරණ ප්‍රචාරක කාර්යාල වර්ග හතරක් (4) පමණක් වන අතර, එවැනි කාර්යාල ස්ථාපිත කළ යුතු ආකාරය පහත දැක්වේ.

* *1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 73 වැනි වගන්තිය යටතේ කාර්යාල පිහිටුවීම පිළිබඳ විස්තර සටහන*

| පිහිටුවිය හැකි කාර්යාල වර්ගය | කාර්යාල පිහිටුවීමට බලය ඇති අය | කාර්යාල පවත්වාගෙන යාහැකි කාලය | කාර්යාල පිහිටුවිය හැකි බල ප්‍රදේශය | පිහිටුවිය හැකි කාර්යාල ගණන | අයදුම් පත්‍රයේ වර්ණය |
|---|---|---|---|---|---|
| නිවේදිත මධ්‍ය මැතිවරණ කාර්යාල | පක්ෂ ලේකම්/ බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක හෝ වෙනත් නියෝජිත | 2020.06.10 දින සිට 2020.08.06 දින මධ්‍යම රාත්‍රිය දක්වා | මැතිවරණ කොට්ඨාස බල ප්‍රදේශය | එක් කාර්යාලයක් පමණි. | කහ |
| නිවේදිත ශාඛා මැතිවරණ කාර්යාල (i) | පක්ෂ ලේකම්/ බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක හෝ වෙනත් නියෝජිත | 2020.06.10 දින සිට 2020.08.03 දින මධ්‍යම රාත්‍රිය දක්වා | එක් එක් *ඡන්ද කොට්ඨාසය* | ඡන්ද කොට්ඨාසයකට එකක් බැගින් | සුදු |
| නිවේදිත ශාඛා මැතිවරණ කාර්යාල (ii) | අපේක්ෂක | 2020.08.04 දින සිට 2020.08.06 දින මධ්‍යම රාත්‍රිය දක්වා | එක් එක් *මැතිවරණ කොට්ඨාසය* | මැතිවරණ කොට්ඨාසයකට එකක් බැගින් එක් අපේක්ෂකයකු ට | ලා රෝස |
| සාමාන්‍ය පදිංචි නිවස, මැතිවරණ කාර්යාලය ලෙස භාවිතා කිරීම | බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක/ අපේක්ෂක | 2020.06.10 සිට 2020.08.06 දින මධ්‍යම රාත්‍රිය දක්වා | එක් එක් අපේක්ෂකයා පදිංචි නිවස | මැතිවරණ කොට්ඨාසයට එක් කාර්යලයක් පමණි | ලා දම් |

*කරුණු පැහැදිලි කිරීම*

*I. මැතිවරණ කොට්ඨාස*

අංක 1 කොළඹ මැතිවරණ කොට්ඨාසයේ සිට අංක 22 කැගල්ල මැතිවරණ කොට්ඨාසය දක්වා වූ *මැතිවරණ කොට්ඨාස 22* කි. අංක 11 වන්නි මැතිවරණ කොට්ඨාසය වවුනියාව, මන්නාරම, මුලතිවු යන පරිපාලන දිස්ත්‍රික්ක වලින් සමන්විත වේ. යාපනය සහ කිලිනොච්චි පරිපාලන දිස්ත්‍රික්ක දෙකෙන් සමන්විත වන මැතිවරණ බල ප්‍රදේශය අංක. 10 යාපනය මැතිවරණ කොට්ඨාසය වශයෙන් ද හැඳින්වෙන අතර අම්පාර පරිපාලන දිස්ත්‍රික්කය අංක. 13 දිගාමඩුල්ල මැතිවරණ කොට්ඨාසය වශයෙන් හැඳින්වෙන අතර සෙසු මැතිවරණ කොට්ඨාසය අදාල පරිපාලන දිස්ත්‍රික්කයේ නමින් හැඳින්වේ.

*II. ඡන්ද ප්‍රදේශය*

ඡන්ද ප්‍රදේශයක් ලෙස හඳුන්වනු ලබන්නේ උතුරු කොළඹ, මතුගම, රත්තොට, අම්බලන්ගොඩ ආදී වශයෙන් වූ පැරණි මැතිවරණ කොට්ඨාසයි. දිවයිනේ *ඡන්ද ප්‍රදේශ 160* ක් ඇත.

*III. ඡන්ද කොට්ඨාසය*

යම් ඡන්ද පොළක දී ඡන්දය දීම සඳහා සුදුසුකම් ලබා ඇති ඡන්ද හිමියන් පදිංචි ප්‍රදේශය ඡන්ද කොට්ඨාසය යනුවෙන් හැඳින්වේ. එක් ඡන්ද ප්‍රදේශයක ඡන්ද කොට්ඨාස ගණනාවක් ඇති අතර අංක 1 සිට පිළිවෙලින් අංක කර ඇත. එක් එක් ඡන්ද කොට්ඨාසය අනුව ඡන්ද හිමි නාමලේඛනය බෙදා වෙන් කළ හැකිය. දිවයිනේ ඡන්ද කොට්ඨාස 12774 ක් ඇත.

*IV. බලයලත් නියෝජිත*

මැතිවරණ කොට්ඨාසයකට තරඟ කරනු ලබන යම් පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් භාරදෙනු ලබන නාමයෝජනා පත්‍රයක මුලින්ම නම සඳහන් අපේක්ෂකයා (15 (4) වගන්තිය)

*V. ස්වාධීන කණ්ඩායම් නායකයා*

මැතිවරණ කොට්ඨාසයකට තරග කරනු ලබන ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට නාමයෝජනා පත්‍රයේ මුලින්ම නම සඳහන් අපේක්ෂකයා 15 (3) වගන්තිය

04. මෙම සෑම කාර්යාලයක්ම නිවේදිත කාර්යාලයක් වියයුතු අතර, "නිවේදිත" යන පාඨය යම් මැතිවරණ කාර්යාලයක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ කාර්යාලය පිහිටුවනු ලැබීමට පෙර එය පිහිටි ප්‍රදේශයේ පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත ද ඒ කාර්යාලය පිහිටි මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධරයා වෙත ද දැනුම් දෙනු ලැබූ බව ඉන් අදහස් වේ. නිවේදිත කාර්යාල පිළිබඳව දැනුම්දීම සඳහා මේ සමග අමුණා ඇති ආකෘති පත්‍රවලින් අදාළ ආකෘති පත්‍රය සෑම කාර්යාලයක් වෙනුවෙන්ම පිටපත් හතරකින් (4) සම්පූර්ණ කර එක් පිටපතක් තේරීම් භාර නිලධාරී/ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. තවත් පිටපතක් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කළ යුතුය. අනෙක් පිටපත අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට භාර දිය යුතු අතර ඉතිරි පිටපත පිහිටුවනු ලබන මැතිවරණ ප්‍රචාරක කාර්යාලයේ තබාගත යුතුය.

05. බලයලත් නියෝජිතයෙකුට හෝ ස්වාධීන කණ්ඩායම් නායකයෙකුට හෝ අපේක්ෂකයකුට තම පදිංචි නිවසේ නැතහොත් ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි වී ඇති නිවසේ මැතිවරණ ප්‍රචාරක කාර්යාලයක් පිහිටුවීමට හිමිකම් ඇත.

06. තවද, මෙවැනි ඡන්ද කාර්යාල ඉදිරිපිට හෝ ආසන්නයේ හෝ පොදු මාර්ගවල වාහන තදබද ඇතිවන සේ නැතහොත් මහජනතාවට බාධා ඇතිවන සේ වාහන නවතා තැබීමෙන්, ආධාරකරුවන් විශාල ප්‍රමාණයක් එක් රැස්කරවීමෙන් වැළකිය යුතු අතර, කාර්යාල පරීක්ෂාවට පැමිණෙන පොලිස් නිලධාරීන්ට හා මැතිවරණ නිලධාරීන්ට ඒ සඳහා උපරිම සහාය ලබාදිය යුතුය. ***ඔවුනට බාධා කිරීම් ඡන්ද විමසීම පැවැත්වීමට බාධා කිරීමක් සිදුකළා සේ සලකා ක්‍රියාකරනු ලැබේ.***

07. ආගමික සිද්ධස්ථාන සතු ඉඩම් හෝ ගොඩනැගිලිවල ඡන්ද කාර්යාල පිහිටුවන්නේ නම් ඒ සඳහා විශේෂ අවසරයක් ලබාගත යුතු අතර ආගමික පුද පූජා කෙරෙන කිසිඳු ස්ථානයක හෙවත් ආගමික සිද්ධස්ථානයක ඡන්ද කාර්යාල පිහිටුවීමට ඉඩදෙනු නො ලැබේ.

**08. නියි පරිදි අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය හා පොලිස් ස්ථානය (මේ අවස්ථාවේදී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය - (MOH කාර්යාලය) වෙත දැනුම් දී ස්ථාපිත කරනු ලබන නිවේදිත මැතිවරණ ප්‍රචාරක කාර්යාලයක පක්ෂයේ නම/ ස්වාධීන කණ්ඩායමක් වන විට "ස්වාධීන කණ්ඩායම අංක - " යන්න සහ පක්ෂයේ / ස්වාධීන කණ්ඩායමේ සළකුණ පමණක් ඇතුළත් එකම එක නාම පුවරුවක් (පතාකයක්) ප්‍රදර්ශනය කල හැකිය. එය එක් රාජ්‍ය භාෂාවකින් පමණක් නම් වර්ග අඩි 40 නොඉක්මවිය යුතු අතර, රාජ්‍ය භාෂා ද්විත්වයම (සිංහල/ දෙමළ) භාවිතා කරන්නේ නම් තවත් අමතර වර්ග අඩි 10 කින් එහි විශාලත්වය වැඩි කළ හැකිය. එම පුවරුව හැර වෙනත් පුවරු, ධජ, පතාක ප්‍රදර්ශනය කිරීම නීත්‍යානුකූල නැත.**

09. Covid 19 සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබාදෙන ලද උපදෙස් හා නිරෝධායන පනතේ විධිවිධාන අනුව සියලුම ඡන්ද කාර්යාල ඉදිරිපිට එයට ඇතුළුවන දොරටුව අසල අත්සේදීම සඳහා හෝ විශබීජ හරණය සඳහා අවශ්‍ය පහසුකම් සලසා තිබිය යුතු අතර ඡන්ද කාර්යාලයට පැමිණෙන සියලුම ආධාරකරුවන්ගේ නම හා අදාළ තොරතුරු ඇතුළත් ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. එය අවශ්‍ය වන්නේ Covid 19 ආසාධිතවීමක් සිදුවුවහොත් සෞඛ්‍ය බලධාරින් අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා පමණකි. මෙය පොලිසියට හෝ වෙනත් ආරක්ෂක අංශයකට හෝ මැතිවරණ කාර්යාලයට ලබා දීම අවශ්‍ය නොවේ.

10. සැමවිටම ප්‍රචාරක කාර්යාල පරිශ්‍රය තුළ ගැවසෙන ආධාරකරුවන් එකිනෙකා අතර මීටරයක දුර පවත්වා ගැනීමට වගබලා ගතයුතු අතර කාර්යාලය තුළ කිසි විටෙකත් කාඩ් ක්‍රීඩා කිරීම, දාම් ඇදීම, කැරම් ක්‍රීඩා කිරීම යනාදිය නොකළ යුතුය. එමෙන්ම මුඛය හා නාසය ආවරණය වන පරිදි මුහුණු ආවරණයක් පැළඳීමද කළයුතුය. තවද, ඡන්ද කාර්යාලය තුළට මැනවින් වාතාශ්‍රය ලැබෙන සේ දොර ජනෙල් විවෘතව තැබිය යුතුය.

11. කිසිදු ඡන්ද කාර්යාලයක දිවයිනේ පොදු නීති, මැතිවරණ නීති සහ Covid 19 වසංගත තතත්වය තුළ මැතිවරණ පැවැත්වීම සම්බන්ධයෙන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා නිකුත් කර ඇති මාර්ගෝපදේශ උල්ලංඝනය කිරීම් සිදු නොවිය යුතු බව ද අවධාරණය කෙරේ.

12. ඉහත දක්වා ඇති කොන්දේසි හා නියම පැනවීමට සිදුව ඇත්තේ ඡන්ද විමසීම් කාල සීමාතුළ ඡන්ද විමසීම් හා බැඳි ගැටුම්, පහරදීම්, තුවාල කිරීම්, මනුෂ්‍ය ඝාතන හා දේශපාලන පළිගැනීම් වැනි නොමනා ක්‍රියා වැළැක්වීම හා මහජනතාවට ඇති විය හැකි අවහිරතා වැළැක්වීම සඳහා මෙන්ම Covid 19 වසංගතය ව්‍යාප්තවීම වැළැක්වීමට අවශ්‍ය පූර්වෝපායන් ගැනීම සියලුම දෙනාගේ වගකීමක් වන හෙයින් එසේ කිරීම සඳහා සහ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය වාතාවරණය ඇති කිරීම පිණිස බැව් දන්වා සිටිනු රිසියෙමි.

මහින්ද දේශප්‍රිය
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව

පිටපත -

1. මැතිවරණ කොමසාරිස් ජනරාල්/ ලේකම්, මැතිවරණ කොමිෂන් සභාව
   - නිසි කටයුතු සඳහා
2. පොලිස්පති
   - දැන ගැනීම සඳහා සහ අදාළ නිලධාරීන් දැනුවත් කිරීම් වස්.
3. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
   - දැන ගැනීම සඳහා සහ නිසි කටයුතු සඳහා
4. සියලුම තේරීම්භාර නිලධාරීන්
   - දැනගැනීම පිණිස හා දිස්ත්‍රික් මැතිවරණ පැමිණිලි විමර්ශන කමිටු හා පොලිස් නිලධාරීන් හරහා මෙම නියම බලාත්මක කිරීම පිණිස.
5. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ)
   - දැනගැනීම සඳහා සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පිණිස.
6. මැතිවරණ මහලේකම් කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන්
   - නිසි කටයුතු සඳහා හා තේරීම් භාර නිලධාරීන් හා සාකච්ඡා කර මෙම නියම උල්ලංඝනය කිරීම් වැළැක්වීම සඳහා අවැසි පියවර ගැනීම් වස්.
7. සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් හා ඡන්ද විමසීම් නීති උල්ලංඝනය වීම් පිළිබඳව විමර්ශනය කිරීමේ නිලධාරීන්
   - බලයලත් නියෝජිතයන් සහ ස්වාධීන කණ්ඩායම් නායකයන් දැනුවත් කර ඔවුන් වෙත මෙම ලිපියේ පිටපත් ලබාදීමට ක්‍රියාකිරීම පිණිස හා තේරීම් භාර නිලධාරීන් හා සාකච්ඡා කර මෙම නියම උල්ලංඝනය කිරීම් වැළැක්වීම සඳහා අවැසි පියවර ගැනීම් වස්.
8. මැතිවරණ පැමිණිලි විමර්ශනය සඳහා වූ ස්ථාවර කමිටුවේ දේශපාලන පක්ෂවල නිත්‍ය නියෝජිතයන්
   - දැන ගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
9. නිරීක්ෂණ සංවිධානවල විධායක අධ්‍යක්ෂවරුන්
   - දැන ගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා

.......................................................................................................

(බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක )
පක්ෂයේ නම/ ස්වාධීන කණ්ඩායම් අංකය - ........................................

ලිපිනය : ...................................................................................

...................................................................................

| |
|---|
| පිටපත් හතරකින් පුරවා එක් පිටපතක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයටත් තවත් පිටපතක් අදාළ පොලිස් ස්ථානයටත්, තුන්වන පිටපත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයටත් භාර දිය යුතුය. ඉතිරි පිටපත මැතිවරණ කාර්යාලයේ තබා ගත යුතුය. |

*(සම්පූර්ණ කිරීමට පෙර පසු පිටේ ඇති උපදෙස් හොඳින් කියවන්න.)*

2020 ......................

තේරීම්භාර නිලධාරී, ........................................ මැතිවරණ කොට්ඨාසය

පොලිස් ස්ථානාධිපති, පොලිස් ස්ථානය, ..........................

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි, ..........................................

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | |
|---|---|
| ඡන්ද ප්‍රදේශ අක්ෂරය | ඡ.කො. අංකය |
| | |

**පාර්ලිමේන්තු මහ මැතිවරණය - 2020**

**මැතිවරණ ප්‍රචාරක කාර්යාල පිහිටුවීම**

1. කාර්යාල වර්ගය : **නිවේදිත මධ්‍ය මැතිවරණ ප්‍රචාරක කාර්යාලය**

2. කාර්යාලයේ පිහිටීම හා අදාළ ස්ථානයේ අයිතිය

   2.1. මැතිවරණ ප්‍රචාරක කාර්යාලයේ ලිපිනය : ................................................
   ................................................

   2.2. ඉහත ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම : ................................................

   2.3. එම ලිපිනයට අදාළ ඡන්ද මධ්‍යස්ථානයේ නම : ................................................

   2.4. එම ලිපිනයේ හිමිකාරීත්වය
   (මෙම ස්ථානය යම් රජයේ ආයතනයකට/ ව්‍යවස්ථාපිත ආයතනයකට අයත් නොවිය යුතු ය.)

   2.4.1 හිමිකරුගේ නම : ................................................

   2.4.2 එම අයගේ තැපැල් ලිපිනය : ................................................
   ................................................

   2.4.3 හිමිකරුගේ දුරකථන අංක : නිවස - .............................. ජංගම - ..............................

3. ප්‍රකාශය

   ඉහත තොරතුරු දක්වා ඇති ස්ථානයේ ඡන්ද විමසීමට අදාළව.............................................. පක්ෂය/ ස්වාධීන කණ්ඩායම සඳහා මැතිවරණ ප්‍රචාරක කාර්යාලයක් පවත්වා ගෙන යන බව මෙයින් දැනුම් දෙමි. එසේම කොවිඩ් වසංගත ව්‍යාප්තිය වැළැක්වීම සඳහා සෞඛ්‍ය බලධාරීන් විසින් නිකුත් කර ඇති උපදෙස්වලට අනුකූලව කටයුතු කරන බවටත්, මැතිවරණ නීති උල්ලංඝනය නොවන සේ පවත්වාගෙන යන බවටත් සහතික වෙමි.

(බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක/ නියෝජිත නම) : ................................................

අත්සන :........................ දිනය : ........................ නිල මුද්‍රාව

| |
|---|
| ** බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක විසින් මෙම ඉල්ලීම කළ යුතු ය.* |

**කාර්යාල පිහිටුවන වසමේ ග්‍රාම නිලධාරිගේ වාර්තාව**

කාර්යාලයීය ලිපිනය : ..............................
..............................

මැතිවරණ ප්‍රචාරක කාර්යාලය පිහිටුවීමට අදාළ ඡන්ද කොට්ඨාස අංකය ................ වන බවත්, එම ස්ථානය කිසිඳු රජයේ ආයතනයකට/ ව්‍යවස්ථාපිත ආයතනයකට අයත් නොවන බවත් වාර්තා කරමි.

නිල මුද්‍රාව

ග්‍රාම නිලධාරි අත්සන :.............................................. දිනය : ......................................

පිටපත් භාර ගැනීම්

| ස්ථානය | භාරගත් අයගේ නම/තනතුර | අත්සන | කාර්යාලයීය නිල මුද්‍රා |
|---|---|---|---|
| දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය ........................ | ........................................ | | |
| පොලිස් ස්ථානය ........................ | ........................................ | | |
| සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය ........................ | ........................................ | | |

උපදෙස් :

1. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 73 වගන්තියෙන් මැතිවරණ ප්‍රචාරක කාර්යාල පිහිටුවීමට නෛතික ප්‍රතිපාදන සලසා දී ඇත. නිසි පරිදි අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය හා පොලිස් ස්ථානය (මේ අවස්ථාවේ දී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය - MOH කාර්යාලය) වෙත *__දැනුම් දී__* ස්ථාපිත කරනු ලබන නිවේදිත මධ්‍ය මැතිවරණ ප්‍රචාරක කාර්යාලයක පක්ෂයේ නම (ස්වාධීන කණ්ඩායමක් වන විට "ස්වාධීන කණ්ඩායමේ අංකය - " යන්න) හා පක්ෂයේ/ ස්වාධීන කණ්ඩායමේ සලකුණ පමණක් ඇතුළත් එකම එක නාම පුවරුවක් (පතාකයක්) ප්‍රදර්ශනය කළ හැකිය. එය එක් රාජ්‍ය භාෂාවකින් පමණක් නම් වර්ග අඩි 40 නොඉක්මවිය යුතු අතර, රාජ්‍ය භාෂා ද්විත්වයකින් (සිංහල/ දෙමළ) භාවිතා කරන්නේ නම් තවත් අමතර වර්ග අඩි 10 කින් එහි විශාලත්වය වැඩි කළ හැකිය.

2. පොලිසිය හෝ වෙන යම් බලධාරියෙකු පැමිණ ඉල්ලා සිටි විටක කාර්යාලය පිහිටුවීමට දැනුම් දීමේ ලිපිය ඉදිරිපත් කළ යුතුය. ඊට අමතරව එහි පිටපතක් කාර්යාලය තුළ ප්‍රදර්ශනය කර තිබිය යුතුය.එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් අදාළ මැතිවරණ ප්‍රචාරක කාර්යාලය ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

3. කාර්යාලය පිහිටුවිය හැකි ආකාරය හා පවත්වාගෙන යා හැකි දින වකවානු මෙසේ ය.

| | | |
|---|---|---|
| නිවේදිත මධ්‍ය මැතිවරණ ප්‍රචාරක කාර්යාලය | එක් බලයලත් නියෝජිතයෙකුට හෝ ස්වාධීන කණ්ඩායම් නායකයකුට මැතිවරණ කොට්ඨාසයකට එකක් බැගින් | **2020.06.10** දින සිට **2020.08.06** දින මධ්‍යම රාත්‍රිය දක්වා |

4. මෙවැනි නිවේදිත මධ්‍ය මැතිවරණ ප්‍රචාරක කාර්යාලයක් ඡන්ද මධ්‍යස්ථානයක සිට මීටර් 500 සීමාවේ පිහිටා ඇත්නම් ඒවා **2020.08.03** දින මධ්‍යම රාත්‍රියේ සිට ඉවත් කළ යුතු ය.

5. කිසියම් පක්ෂයක්/ කණ්ඩායමක් වෙනුවෙන් පිහිටුවන කාර්යාලය තුළ වෙනත් පක්ෂයක හෝ කණ්ඩායමක අපේක්ෂකයෙකුගේ ප්‍රචාරක කටයුතු සිදුනොකළ යුතු ය.

6. සෞඛ්‍ය නිලධාරීන්ගේ මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය.
   1. මුඛය හා නාසය ආවරණය වන මුව ආවරණ පැළඳීම.
   2. පුද්ගල දුරස්ථ බව හෙවත් මීටරයක අවම දුරක් පවත්වා ගැනීම.
   3. සබන් හා ජලය හෝ විෂබීජහරණ දියර මගින් අත් පිරිසිදු කිරීම සිදුකර අත් පිරිසිදුව තබා ගැනීම.

..............................................................................................
( බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක, නියෝජිත නම)
පක්ෂයේ නම/ ස්වාධීන කණ්ඩායම් අංකය - ...........................................
ලිපිනය : .........................................................................................
..............................................................................
*(සම්පූර්ණ කිරීමට පෙර පසු පිටේ ඇති උපදෙස් හොඳින් කියවන්න.)*

පිටපත් හතරකින් පුරවා එක් පිටපතක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයටත් තවත් පිටපතක් අදාළ පොලිස් ස්ථානයටත්, තුන්වන පිටපත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයටත් භාර දිය යුතුය. ඉතිරි පිටපත මැතිවරණ කාර්යාලයේ තබා ගත යුතුය.

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | |
|---|---|
| ඡන්ද ප්‍රදේශ අක්ෂරය | ඡ.කො. අංකය |
| | |

2020 .......................
**තේරීම්භාර නිලධාරී,** ....................................... දිස්ත්‍රික්කය.
**පොලිස් ස්ථානාධිපති, පොලිස් ස්ථානය,** ...............................
**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,** .......................................................

**පාර්ලිමේන්තු මහ මැතිවරණය - 2020**
**මැතිවරණ ප්‍රචාරක කාර්යාල පිහිටුවීම**

1. කාර්යාල වර්ගය : **නිවේදිත ශාඛා මැතිවරණ ප්‍රචාරක කාර්යාලය**

**2020.08.03 දින මධ්‍යම රාත්‍රිය ඉකුත් වීමට පෙර ඉවත් කළ යුතු ය**

2. කාර්යාලයේ පිහිටීම හා අදාළ ස්ථානයේ අයිතිය
   - 2.1. මැතිවරණ ප්‍රචාරක කාර්යාලයේ ලිපිනය : .................................................................................
     .................................................................................
   - 2.2 ඉහත ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරී වසම : .................................................................................
   - 2.3 එම ලිපිනයට අදාළ ඡන්ද මධ්‍යස්ථානයේ නම : .................................................................................
   - 2.4 එම ලිපිනයේ හිමිකාරීත්වය
     (මෙම ස්ථානය යම් රජයේ ආයතනයකට/ ව්‍යවස්ථාපිත ආයතනයකට අයත් නොවිය යුතු ය.)
     - 2.4.1 හිමිකරුගේ නම : .................................................................................
     - 2.4.2 එම අයගේ තැපැල් ලිපිනය : .................................................................................
       .................................................................................
     - 2.4.3 හිමිකරුගේ දුරකථන අංක : නිවස - .................................... ජංගම - ....................................

3. **ප්‍රකාශය**
   ඉහත තොරතුරු දක්වා ඇති ස්ථානයේ ඡන්ද විමසීමට අදාළව ................................................ පක්ෂය/ ස්වාධීන කණ්ඩායම සඳහා මැතිවරණ ප්‍රචාරක කාර්යාලයක් පවත්වා ගෙන යන බව මෙයින් දැනුම් දෙමි. එසේම කොවිඩ් වසංගතය ව්‍යාප්තිය වැළැක්වීම සඳහා සෞඛ්‍ය බලධාරීන් විසින් නිකුත් කර ඇති උපදෙස්වලට අනුකූලව කටයුතු කරන බවටත් මැතිවරණ නීති උල්ලංඝනය නොවන සේ පවත්වාගෙන යන බවටත් සහතික වෙමි.

(බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක/ නියෝජිත නම) : .................................................................................
අත්සන :............................................ දිනය : ...................................... නිල මුද්‍රාව

**කාර්යාල පිහිටුවන වසමේ ග්‍රාම නිලධාරීගේ වාර්තාව**

කාර්යාලයීය ලිපිනය : ......................................
......................................

මැතිවරණ ප්‍රචාරක කාර්යාලය පිහිටුවීමට අදාළ ඡන්ද කොට්ඨාස අංකය ............... වන බවත්, එම ස්ථානය කිසිඳු රජයේ ආයතනයකට/ ව්‍යවස්ථාපිත ආයතනයකට අයත් නොවන බවත් වාර්තා කරමි.

නිල මුද්‍රාව

ග්‍රාම නිලධාරී අත්සන :............................................ දිනය : ......................................

පිටපත් භාර ගැනීම්

| ස්ථානය | භාරගත් අයගේ නම/තනතුර | අත්සන | කාර්යාලයීය නිල මුද්‍රා |
|---|---|---|---|
| දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය<br>...................... | ........................................ | | |
| පොලිස් ස්ථානය<br>...................... | ........................................ | | |
| සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය<br>...................... | ........................................ | | |

උපදෙස් :

1. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 73 වගන්තියෙන් මැතිවරණ ප්‍රචාරක කාර්යාල පිහිටුවීමට නෛතික ප්‍රතිපාදන සලසා දී ඇත. නිසි පරිදි අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය හා පොලිස් ස්ථානය (මේ අවස්ථාවේ දී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය - MOH කාර්යාලය) වෙත *<u>දැනුම් දී</u>* ස්ථාපිත කරනු ලබන නිවේදිත ශාඛා මැතිවරණ කාර්යාලයක පක්ෂයේ නම (ස්වාධීන කණ්ඩායමක් වන විට "ස්වාධීන කණ්ඩායමේ අංකය - " යන්න) හා පක්ෂයේ/ ස්වාධීන කණ්ඩායමේ සලකුණ පමණක් ඇතුළත් එකම එක නාම පුවරුවක් (පතාකයක්) ප්‍රදර්ශනය කළ හැකිය. එය එක් රාජ්‍ය භාෂාවකින් පමණක් නම් වර්ග අඩි 40 නොඉක්මවිය යුතු අතර, රාජ්‍ය භාෂා ද්විත්වයකින් (සිංහල/ දෙමළ) භාවිතා කරන්නේ නම් තවත් අමතර වර්ග අඩි 10 කින් එහි විශාලත්වය වැඩි කළ හැකිය.

2. පොලිසිය හෝ වෙන යම් බලධාරියෙකු පැමිණ ඉල්ලා සිටි විටක කාර්යාලය පිහිටුවීමට දැනුම් දීමේ ලිපිය ඉදිරිපත් කළ යුතුය. ඊට අමතරව එහි පිටපතක් කාර්යාලය තුළ ප්‍රදර්ශනය කර තිබිය යුතුය.එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් අදාළ ඡන්ද විමසීම් කාර්යාලය ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

3. කාර්යාල පිහිටුවිය හැකි ආකාරය හා පවත්වාගෙන යා හැකි දින වකවානු මෙසේ ය.

| | | |
|---|---|---|
| නිවේදිත ශාඛා මැතිවරණ ප්‍රචාරක කාර්යාලය | එක් එක් පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට එක් ඡන්ද කොට්ඨාසයකට එකක් බැගින් | 2020.06.10 දින සිට 2020.08.03 දින මධ්‍යම රාත්‍රිය දක්වා |

4. මෙවැනි නිවේදිත ශාඛා මැතිවරණ ප්‍රචාරක කාර්යාලයක් ඡන්ද මධ්‍යස්ථානයක සිට මීටර් 500 සීමාවේ පිහිටා ඇත්නම් ඒවා **2020.08.03** දින මධ්‍යම රාත්‍රියේ සිට ඉවත් කළ යුතු ය.

5. කිසියම් පක්ෂයක්/ කණ්ඩායමක් වෙනුවෙන් පිහිටුවන කාර්යාලය තුළ වෙනත් පක්ෂයක හෝ කණ්ඩායමක අපේක්ෂකයෙකුගේ ප්‍රචාරක කටයුතු සිදුනොකළ යුතු ය.

6. සෞඛ්‍ය නිලධාරීන්ගේ මාර්ගෝපදේශ
   i. මුඛය හා නාසය ආවරණය වන මුව ආවරණ පැළඳීම.
   ii. පුද්ගල දුරස්ථ බව හෙවත් මීටරයක අවම දුරක් පවත්වා ගැනීම.
   iii. සබන් ගා ජලය හෝ විෂබීජහරණ දියර මගින් අත් පිරිසිදු කිරීම සිදුකර අත් පිරිසිදුව තබා ගැනීම.

| |
|---|
| පිටපත් හතරකින් පුරවා එක් පිටපතක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයටත් තවත් පිටපතක් අදාළ පොලිස් ස්ථානයටත්, තුන්වන පිටපත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයටත් භාර දිය යුතුය. ඉතිරි පිටපත මැතිවරණ කාර්යාලයේ තබා ගත යුතුය. |

.............................................................................................

බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක/ නියෝජිත නම :

පක්ෂයේ නම/ ස්වාධීන කණ්ඩායම් අංකය - .........................................

ලිපිනය : .............................................................................................

දුරකථන අංක : .....................................................................................

*(සම්පූර්ණ කිරීමට පෙර පසු පිටේ ඇති උපදෙස් හොඳින් කියවන්න.)*

2020.......................

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | |
|---|---|
| ඡන්ද ප්‍රදේශ අක්ෂරය | ජ.කො. අංකය |
| | |

**තේරීම්භාර නිලධාරී,** ............................................. දිස්ත්‍රික්කය.

**පොලිස් ස්ථානාධිපති,** පොලිස් ස්ථානය, ...............................

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,** ..................................................

**පාර්ලිමේන්තු මහ මැතිවරණය - 2020**

**මැතිවරණ ප්‍රචාරක කාර්යාල පිහිටුවීම**

1. කාර්යාල වර්ගය :

| |
|---|
| **එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් මැතිවරණ කොට්ඨාසය සඳහා වූ නිවේදිත ශාඛා මැතිවරණ ප්‍රචාරක කාර්යාලය** |

| |
|---|
| **2020.08.04, 05, 06 දින සඳහා පමණි.** |

2. කාර්යාලයේ පිහිටීම හා අදාළ ස්ථානයේ අයිතිය
   - 2.1. මැතිවරණ ප්‍රචාරක කාර්යාලයේ ලිපිනය: .....................................................................................
   .......................................................................................................
   - 2.2. ඉහත ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරී වසම : .........................................................................
   - 2.3 එම ලිපිනයට අදාළ ඡන්ද මධ්‍යස්ථානයේ නම : ......................................................................
   - 2.4 එම ලිපිනයේ හිමිකාරිත්වය
   (මෙම ස්ථානය යම් රජයේ ආයතනයකට/ ව්‍යවස්ථාපිත ආයතනයකට අයත් නොවිය යුතු ය.)
     - 2.4.1. හිමිකරුගේ නම : .....................................................................................
     - 2.4.2. එම අයගේ තැපැල් ලිපිනය : ............................................................................
     ......................................................................................................
     - 2.4.3. හිමිකරුගේ දුරකථන අංක : නිවස - ................................... ජංගම - ..................................

3. **ප්‍රකාශය**

ඉහත තොරතුරු දක්වා ඇති ස්ථානයේ ඡන්ද විමසීමට අදාළව බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක වන ............................................................... ස්වාමීන්වහන්ස/ මහතා/ මිය සඳහා ඡන්ද විමසීම් කාර්යාලයක් පවත්වා ගෙන යන බව මෙයින් දැනුම් දෙමි. එසේම කොවිඩ් වසංගත ව්‍යාප්තිය වැළැක්වීම සඳහා සෞඛ්‍ය බලධාරීන් විසින් නිකුත් කර ඇති උපදෙස්වලට අනුකූලව කටයුතු කරන බවටත් මැතිවරණ නීති උල්ලංඝනය නොවන සේ පවත්වාගෙන යන බවටත් සහතික වෙමි.

(බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක/ නියෝජිත නම) : ......................................................................

අත්සන :................................................ දිනය : ........................................ නිල මුද්‍රාව

**කාර්යාල පිහිටුවන වසමේ ග්‍රාම නිලධාරීගේ වාර්තාව**

කාර්යාලයීය ලිපිනය : ........................................
........................................

මැතිවරණ ප්‍රචාරක කාර්යාලය පිහිටුවීමට අදාළ ඡන්ද කොට්ඨාස අංකය ................ වන බවත්, එම ස්ථානය කිසිඳු රජයේ ආයතනයකට/ ව්‍යවස්ථාපිත ආයතනයකට අයත් නොවන බවත් වාර්තා කරමි.

| |
|---|
| නිල මුද්‍රාව |

ග්‍රාම නිලධාරී අත්සන :................................................ දිනය : ........................................

පිටපත් භාර ගැනීම්

| ස්ථානය | භාරගත් අයගේ නම/තනතුර | අත්සන | කාර්යාලයීය නිල මුද්‍රා |
|---|---|---|---|
| දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය ...................... | .................................................. | | |
| පොලිස් ස්ථානය ...................... | .................................................. | | |
| සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ...................... | .................................................. | | |

උපදෙස් :

1. කාර්යාල පිහිටුවිය හැකි ආකාරය හා පවත්වාගෙන යා හැකි දින වකවානු මෙසේ ය.

| | | |
|---|---|---|
| **එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් නිවේදිත ශාඛා මැතිවරණ ප්‍රචාරක කාර්යාලයක්** | **එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් මැතිවරණ කොට්ඨාස සඳහා එකක් බැගින්** | **2020.08.04 දින සිට 2020.08.06 දින මධ්‍යම රාත්‍රිය දක්වා** |

2. සෞඛ්‍ය නිලධාරීන්ගේ මාර්ගෝපදේශ

   i. මුඛය හා නාසය ආවරණය වන මුව ආවරණ පැළඳීම.

   ii. පුද්ගල දුරස්ථ බව හෙවත් මීටරයක අවම දුරක් පවත්වා ගැනීම.

   iii. සබන් හා ජලය හෝ විෂබීජහරණ දියර මගින් අත් පිරිසිදු කිරීම සිදුකර අත් පිරිසිදුව තබා ගැනීම.

අපේක්ෂකයාගේ නම ..............................................................................
පක්ෂයේ නම/ ස්වාධීන කණ්ඩායම් අංකය - ......................................
ලිපිනය : ..........................................................................................
..........................................................................................
දුරකථන අංකය : .............................................................................
*(සම්පූර්ණ කිරීමට පෙර පසු පිටේ ඇති උපදෙස් හොඳින් කියවන්න.)*

පිටපත් හතරකින් පුරවා එක් පිටපතක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයටත් තවත් පිටපතක් අදාළ පොලිස් ස්ථානයටත්, තුන්වන පිටපත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයටත් භාර දිය යුතුය. ඉතිරි පිටපත මැතිවරණ කාර්යාලයේ තබා ගත යුතුය.

2020.......................

**තේරීම්භාර නිලධාරී,** ...................................... දිස්ත්‍රික්කය.
**පොලිස් ස්ථානාධිපති, පොලිස් ස්ථානය,** ..............................
**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,** ..............................................

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | |
|---|---|
| ඡන්ද ප්‍රදේශ අක්ෂරය | ඡ.කො. අංකය |
| | |

## පාර්ලිමේන්තු මහ මැතිවරණය - 2020
## මැතිවරණ ප්‍රචාරක කාර්යාල පිහිටුවීම

1. කාර්යාල වර්ගය : **අපේක්ෂකයාගේ සාමාන්‍ය පදිංචි නිවස**

2. කාර්යාලයේ පිහිටීම හා අදාළ ස්ථානයේ අයිතිය
   2.1 අපේක්ෂකයා සාමාන්‍යයෙන් පදිංචි නිවසේ ලිපිනය :..........................................
   2.2 ඉහත ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරී වසම : ..........................................
   2.3 එම ලිපිනයට අදාළ ඡන්ද මධ්‍යස්ථානයේ නම : ..........................................
   2.4 එම ලිපිනයේ හිමිකාරීත්වය - මෙම ස්ථානයේ අයිතිකරු නොවේනම්,
   (මෙම ස්ථානය යම් රජයේ ආයතනයකට/ ව්‍යවස්ථාපිත ආයතනයකට අයත් නොවිය යුතු ය.)
   2.4.1 හිමිකරුගේ නම : ..........................................
   2.4.2 එම අයගේ තැපැල් ලිපිනය : ..........................................
   2.4.3 හිමිකරුගේ දුරකථන අංක : නිවස - .................................. ජංගම - ..........................................

3. **ප්‍රකාශය**
   ඉහත තොරතුරු දක්වා ඇති ස්ථානයේ ඡන්ද විමසීමට අදාළව බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක වන ........................................................ ස්වාමින්වහන්ස/ මහතා/ මිය සඳහා මැතිවරණ ප්‍රචාරක කාර්යාලයක් පවත්වා ගෙන යන බව මෙයින් දැනුම් දෙමි. එසේම කොවිඩ් වසංගත ව්‍යාප්තිය වැළැක්වීම සඳහා සෞඛ්‍ය බලධාරීන් විසින් නිකුත් කර ඇති උපදෙස්වලට අනුකූලව කටයුතු කරන බවටත් මැතිවරණ නීති උල්ලංඝනය නොවන සේ පවත්වාගෙන යන බවටත් සහතික වෙමි.

අපේක්ෂකයාගේ නම -..........................................................................
පක්ෂයේ නම/ ස්වාධීන කණ්ඩායම් නායකයාගේ නම - ..........................................

අත්සන : .......................................... දිනය : .......................................... නිල මුද්‍රාව

* තරඟ කරනු ලබන අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කළ යුතු ය.

**කාර්යාල පිහිටුවන වසමේ ග්‍රාම නිලධාරීගේ වාර්තාව**

කාර්යාලයීය ලිපිනය : ..........................................
..........................................

මැතිවරණ ප්‍රචාරක කාර්යාලය පිහිටුවීමට අදාළ ඡන්ද කොට්ඨාස අංකය ................ වන බවත්, එම ස්ථානය කිසිඳු රජයේ ආයතනයකට/ ව්‍යවස්ථාපිත ආයතනයකට අයත් නොවන බවත් වාර්තා කරමි.

නිල මුද්‍රාව

අත්සන :.......................................... දිනය : ..........................................

පිටපත් භාර ගැනීම

| ස්ථානය | භාරගත් අයගේ නම/තනතුර | අත්සන | කාර්යාලයීය නිල මුද්‍රා |
|---|---|---|---|
| දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය .................... | .......................................... | | |
| පොලිස් ස්ථානය .................... | .......................................... | | |
| සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය .................... | .......................................... | | |

උපදෙස් :

1. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 73 වගන්තියෙන් මැතිවරණ ප්‍රචාරක කාර්යාල පිහිටුවීමට නෛතික ප්‍රතිපාදන සලසා දී ඇත. නිසි පරිදි අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය හා පොලිස් ස්ථානය (මේ අවස්ථාවේ දී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය - MOH කාර්යාලය) වෙත *දැනුම් දී* ස්ථාපිත කරනු ලබන අපේක්ෂකයාගේ සාමාන්‍ය පදිංචි නිවසක පවත්වාගෙන යනු ලබන මැතිවරණ ප්‍රචාරක කාර්යාලයක පක්ෂයේ නම (ස්වාධීන කණ්ඩායමක් වන විට "ස්වාධීන කණ්ඩායමේ අංකය - " යන්න) හා පක්ෂයේ/ ස්වාධීන කණ්ඩායමේ සලකුණ පමණක් ඇතුළත් එකම එක නාම පුවරුවක් (පතාකයක්) ප්‍රදර්ශනය කළ හැකිය. එය එක් රාජ්‍ය භාෂාවකින් පමණක් නම් වර්ග අඩි 40 නොඉක්මවිය යුතු අතර, රාජ්‍ය භාෂා ද්විත්වයකින් (සිංහල/ දෙමළ) භාවිතා කරන්නේ නම් තවත් අමතර වර්ග අඩි 10 කින් එහි විශාලත්වය වැඩි කළ හැකිය.

2. පොලිසිය හෝ වෙන යම් බලධාරියෙකු පැමිණ ඉල්ලා සිටි විටක කාර්යාලය පිහිටුවීමට දැනුම් දීමේ ලිපිය ඉදිරිපත් කළ යුතුය. ඊට අමතරව එහි පිටපතක් කාර්යාලය තුළ ප්‍රදර්ශනය කර තිබිය යුතුය.එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් අදාළ ඡන්ද විමසීම් කාර්යාලය ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

3. කාර්යාල පිහිටුවිය හැකි ආකාරය හා පවත්වාගෙන යා හැකි දින වකවානු මෙසේ ය.

| | | |
|---|---|---|
| අපේක්ෂකයාගේ සාමාන්‍ය පදිංචි නිවස | එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් | 2020.06.10 දින සිට 2020.08.06 දින මධ්‍යම රාත්‍රිය දක්වා |

4. අපේක්ෂකයා පදිංචි නිවස ඡන්ද විමසීම් කාර්යාලයක් ලෙස භාවිතා කළ හැකිය. එසේම අපේක්ෂකයාගේ නිවස ජනාකීර්ණ ස්ථානයක පිහිටා නොමැති අවස්ථාවක දී තේරීම්භාර නිලධාරි වෙත කෙරෙන ලිඛිත ඉල්ලීමක් සලකා බලා නිවස පිහිටි ග්‍රාම නිලධාරි වසම තුළම ඇති ජනාකීර්ණ ස්ථානයක පිහිටි වෙනත් ගොඩනැගිල්ලක් ඒ සඳහා යොදා ගැනීමට අවසර දෙනු ලැබේ.

5. මෙවැනි අපේක්ෂකයාගේ සාමාන්‍ය පදිංචි නිවසක පවත්වාගෙන යනු ලබන මැතිවරණ ප්‍රචාරක කාර්යාලයක් ඡන්ද මධ්‍යස්ථානයක සිට මීටර් 500 සීමාවේ පිහිටා ඇත්නම් ඒවා 2020.08.03 දින මධ්‍යම රාත්‍රියේ සිට ඉවත් කළ යුතු ය.

6. කිසියම් පක්ෂයක්/ කණ්ඩායමක් වෙනුවෙන් පිහිටුවන කාර්යාලය තුළ වෙනත් පක්ෂයක හෝ කණ්ඩායමක අපේක්ෂකයෙකුගේ ප්‍රචාරක කටයුතු සිදුනොකළ යුතු ය.

7. සෞඛ්‍ය නිලධාරීන්ගේ මාර්ගෝපදේශ

   i. මුඛය හා නාසය ආවරණය වන මුව ආවරණ පැළඳීම.

   ii. පුද්ගල දුරස්ථ බව හෙවත් මීටරයක අවම දුරක් පවත්වා ගැනීම.

   iii. සබන් ගා ජලය හෝ විෂබීජහරණ දියර මගින් අත් පිරිසිදු කිරීම සිදුකර අත් පිරිසිදුව තබා ගැනීම